# අභිලේඛන මූලාශ්‍රය මගින් හෙළිවන පුරාතන ලංකාවේ නාවිකයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

පී. එන්. එම්. සමරතුංග,[1] එන්. එස්. යූ. නැලිගම,[2] එම්. ඒ. ප්‍රසාද් කුමාර[3]

[1,2]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

[3]මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

[1]*niroshasamarathungas@gmail.com*, [2]*sajirauneligama@gmail.com*, [3]*prasadmallawaarachchi85@gmail.com*

***ප්‍රමුඛ පද:*** අභිලේඛන සාධක, නාවිකයන්, පුරාණ ලංකාව, වරායන්

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාව ක්‍රි.පූ. 2 වන සියවසේ සිට ම වෙළඳ මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රසිද්ධ වීමත් දිවයිනෙන් රතු මැණික්, ඇත් දත්, පිට රටට යැවූ බවත් මෙගස්තිනී හා ටොලමි ආදීන්ගේ ප්‍රකාශනවලින් තහවුරු වේ. එමෙන් ම මෝසම් සුළං සංවහන රටාව නාවික ගමනාගමනයට එකතු වීමෙන් ප්‍රාදේශීය හා මහද්වීපික වාණිජ දේශපාලන සංස්කෘතික සබඳතා වර්ධනය වන්නට හේතු විය. මේ අනුව ලංකාවේ ඓතිහාසිකව පැවති නාවික සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීම ලේඛනගත තොරතුරු හා පුරාවිද්‍යාත්මක සාධක මගින් තහවුරු කළ හැකි ය. උක්ත පර්යේෂණය මගින් අභිලේඛන සාධක උපයෝගී කරගනිමින් පුරාතන ලංකාවේ නාවිකයන් පිළිබඳ කරුණු විමර්ශනාත්මක ව අධ්‍යයනය කරනු ලැබේ. එනම් සමකාලීන සමාජයේ නාවික කටයුතු හා ජාත්‍යන්තර සබඳතා (දූත මෙහෙයන්) වෙළඳ ආර්ථික කටයුතු සිදු කිරීම සඳහා නාවිකයන් කෙබඳු දායකත්වයක් දක්වා ඇත් ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ ගැටලුව වේ. මේ සඳහා අභිලේඛන මූලාශ්‍රය ආශ්‍රයෙන් තොරතුරු විමර්ශනය කරමින් ඉදිරිපත් කිරීම අධ්‍යයනයේ අරමුණ වේ. මේ සඳහා ආඬියාගල ලෙන් ලිපිය, අනුරාධපුර අභයගිරි ගල් කුලක ලිපිය, දුවේගල ලෙන් ලිපිය, හඳගල ලිපිය, භගවා ලෙණේ ලිපිය, පරමාකන්ද ලිපිය, අභයගිරි දාගැබ් මළුවේ ලිපිය ආදි අභිලේඛන පාදක කරගන්නා ලදී.

## 2. සාහිත්‍ය විමර්ශනය

ස්වාභාවික හා භූ භෞතික පිහිටීම අනුව ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ අතිශය වැදගත් වූ නාවික කේන්ද්‍රස්ථානයක පිහිටා ඇත. ලංකාව වටා වරායන් රාශියක් පිහිටා ඇති අතර කල්‍යාණි, මහාතිත්ථ, ජම්බුකෝළ පට්නම්, ගෝකණ්ණ තිත්ථ, ගොඩවාය ඉපැරණි වරායන් කිහිපයක් උදාහරණ වේ. පෙර අපර දෙදිගින් ම නාවික ගමනාගමනයේ ප්‍රමුඛතම නාවික මධ්‍යස්ථානය බවට පුරාණ ලංකාව පත්වීමට මෙම වරාය පද්ධති බලපාන ලදී. ඉපැරණි නාවික කටයුතු විමසීමේ දී ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා සමුද්‍රය සමග සම්බන්ධතා පැවැත් වූ බවට සාධක අනාවරණය වී තිබේ. එනම් ප්‍රාග් ඓතිහාසික ක්ෂේත්‍රවලින් හමුවන සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා අතර කරදිය පරිසර පද්ධතිවලින් හමුවන මත්ස්‍ය සහ මෘද්වංශික සත්ත්ව විශේෂවලට අයත් අවශේෂවලින් තැනූ නිර්මාණ හමු වී තිබීමයි. මානවයා තම විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම අරභයා ආර්ථික රටාවකට හුරු වූ අතර එහි වර්ධනීය අවස්ථාවේ අභ්‍යන්තර වෙළඳාම මෙන් ම බාහිර වෙළඳාම පිළිබඳ අවධානය යොමුකිරීමක් දක්නට ලැබේ. බාහිර වෙළදාම් හේතුවෙන් මිනිසා දියඹ තරණය කිරීමට යොමු වීම මානව ශිෂ්ටාචාරයේ සිදු වූ අද්විතීය ජයග්‍රහණයක් වූ අතර ඒ මගින් නාවික ගමනාගමන කටයුතු වර්ධනීය අවධියක් කරා ගමන් කරන්නට විය. මේ පිළිබඳ අධ්‍යනය කිරීමේ දී

සෙනරත් පරණවිතානගේ Inscription of Ceylon, 1970, 1833 ඔස්සේ ප්‍රකාශයට පත් කළ ශිලා ලේඛන, නන්දසේන මුදියන්සේගේ සිංහල ශිලා ලේඛන සංග්‍රහය, කොත්මලේ අමරවංශ හිමිගේ ලක්දිව සෙල්ලිපි වැනි මූලාශ්‍රය ඇසුරෙන් වැදගත් ශිලා ලේඛන දත්ත රැසක් සපයා ගත හැකි ය.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සිදු කිරීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණය හා ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රමවේදවලින් දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදී. සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනයෙන් දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත උපයෝගි කරගන්නා ලද අතර ක්ෂේත්‍ර ගවේෂණය යටතේ සෘජු නිරීක්ෂණයෙන් දත්ත රැස්කර ගන්නා ලදී. අවසාන වශයෙන් දත්ත ඉදිරිපත් කිරීම සඳහා බහුමාධ්‍ය භාවිත කරන ලදී.

## 4. ප්‍රතිඵල හා සාකච්ඡාව

නාවික කටයුතු පිළිබඳ පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛනවලින් තොරතුරු හෙළිවන අතර පොළොන්නරු දිස්ත්‍රික්කයේ දුවේගල ලිපියේ "හරත ශගරකිතශ ලෙණේ" (හර්තෘ සාගර කීර්තිගේ ලෙණයි) යනුවෙන් සඳහන් වේ. මෙම ලෙණ පූජාකර ඇත්තේ නාවිකයෙකු යැයි සිතීමට මෙහි ඇති රූප සටහන අනුබල සපයයි. ආඬියාගල ලිපියේ "හොජකටකස නවිකස පද ගඩිනි" හොජකට (ස්ථානයට යමින් සිටි) නාවිකයාගේ පියගැටයි යනුවෙන් සඳහන් වේ. හඳගල ලිපියේ "නවිකහ මතය උපසික සමණිය ලෙණේ චතු දිස සගපතිට පිතේ" (නාවිකයාගේ මව වන උපාසිකා සමනියගේ ලෙණ සිවුදිග සංඝයාට ය) යනුවෙන් දැක්වේ. එසේ ම පරමාකන්ද ශිලාලේඛනයක "පරුමක අ දුත නවිකහ බය පුත පරුමක තිශ ලෙණෙ ශගශ" (ප්‍රමුඛ අභයගේ පුත්‍ර ප්‍රමුඛ තිස්ස නම් (දූත) නාවිකයාගේ ලෙණ සංඝයාට ය) යැයි පැවසේ. මෙහි සඳහන් පරුමක තිස්ස නම් නාවිකයා දූතයකු වශයෙන් ක්‍රියා කර ඇත. පරමාකන්ද ලිපියෙහි "පරුමක අභය පුත පරුමක තිශහ- දුට කණ- යතහ වොඩි" මෙම ශිලාලේඛනයට අනුව ප්‍රමුඛ අභයගේ පුත්‍ර දෘෂ්ඨ කර්ණ යාත්‍රික ප්‍රමුඛ තිස්සගේ සැළියයි. " පරුමක බරුකචග- මලහ ලෙණෙ සගස" බගවා ලෙණේ ලිපියකට අනුව භාරුකච්ච- ගාමි (නැවියකු) වූ ප්‍රමුඛ මලගේ ලෙණ සංඝයාට ය. භාරුකච්චගාමී යනුවෙන් භාරුකච්ච තොටුපල බලා ඇදෙන නාවිකයෙකු පිළිබඳ අනාවරණය වේ. අභයගිරිය ආශ්‍රිත ගල් කුලෙක දක්නට ලැබෙන ලිපියේ "---- අශනේ (උෟ) කබිර ශුඣතහ (ඒ) නවික කාරවහ අශනෙ" --- ආසනය උෟ කුබිර සුජාතාගේ (ඒ) කාරහ නැවියාගේ ආසනයයි. අභයගිරි දාගැබ් මළුවේ ලිපියකින් ද නාවුක කටයුතු පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. ඒ අනුව "සමුදුරු වරැ සියනා පතියහන් තැබූ පහණි" එනම් සමුද්‍ර කටයුතුවල යෙදුන සේනාපතියෙකු විසින් තබන ලද ගලකි යනුවෙන් අභිලේඛන රාශියකින් නාවික කටයුතු පිළිබඳ කරුණු අනාවරණය කර ගත හැකි ය.

## 5. නිගමන සහ යෝජනා

ක්‍රිස්තු පූර්ව යුගයට අයත් සෙල්ලිපි මගින් කාලීන සමාජ කටයුතු මෙන් ම නාවික කටයුතුවල පැවති තත්ත්වය තහවුරු කරන සාධක පෙන්වා දීමට හැකි ය. ශිලාලේඛන සාධක විමසා බැලීමේ දී එකල නැවියන් සමාජයේ ඉහළ රැකියාවක නියුතු වූ අයෙකු බවට පැහැදිලි වේ. පූර්ව බ්‍රාහ්මී යුග පටන් නාවික කටයුතු පිළිබඳ දැනුම ඔවුන් සතු වූ බව ශිලා ලේඛන මගින් තහවුරු වේ. එමෙන් ම එකළ වරායන් ආශ්‍රිතව පැවතියා වූ නාවික ගමනාගමනය මගින් ඉපැරණි නාවික තාක්ෂණය ප්‍රචලිත වීමෙන් විදේශ වෙළඳ නිජබිම් කරා ලාංකේය භාණ්ඩ ප්‍රවාහනය කිරීම හා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවා ගොඩනැංවීමට නාවිකයන් දායකත්වය සපයා ඇති බව මෙම අධ්‍යයනය මගින් තහවුරු වේ. පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛන පමණක්

නොව පසුකාලීනව හමුවන ශිලාලේඛන මූලාශ්‍රය වන පළමුවන පරාක්‍රමබාහු රජුගේ නයිනතිව් ශිලාලේඛනය, හම්බන්තොටින් හමු වූ ගොඩවායේ ගෝණ පබ්බත ශිලා ලේඛනය, ගාල්ල ප්‍රදේශයේ ත්‍රෛයිභාෂා ශිලාලේඛනය ආදිය මගින් එවකට පැවති නාවික කටයුතු හා වරායන් පිළිබඳ ව මෙන්ම ජාත්‍යන්තර සබඳතා පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. මේ අනුව සාහිත්‍ය මූලාශ්‍රයගත ව සඳහන්වන නාවික කටයුතු පිළිබඳ ලිඛිත සාධකවල සත්‍යතාව උක්ත අභිලේඛන සාධක මගින් තහවුරු වේ.

## 6. ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය


අමරවංශ, කේ. (1969). *ලක්දිව සෙල්ලිපි.* වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණාලය.

මුදියන්සේ, එන්. (2000). *සිංහල ශිලාලේඛන සංග්‍රහය.* කොළඹඃ එස්. ගොඩගේ සහෝදරයෝ.

Paranavithana, S. (1833). *Inscription of Ceylon.* Colombo: Department of Archaeology.

Paranvithana, S. (1970). *Inscription of Ceylon.* Colombo: Department of Archaeology.